රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 19/2019

මගේ අංකය: EST 5/4/24(XXXIII)
රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ
ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2019.07.09

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**වැටුප් වර්ධක දිනයේ දීම උසස්වීම ලැබීමේ දී සහ නිලධරයාගේ මනාපය මත පූර්ව තනතුරට පැමිණීමේ දී අදාළ කර ගත යුතු වැටුප් පියවර තීරණය කිරීම**

ආයතන සංග්‍රහයේ I වැනි කාණ්ඩයේ VII වැනි පරිච්ඡේදයේ 5 වගන්තිය සහ 6:3 උපවගන්තිය කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි.

02. වැටුප් වර්ධක දිනයේ දීම උසස්වීම් ලැබීම මත පිහිටුවිය යුතු වැටුප් පියවර සම්බන්ධව ආයතන සංග්‍රහයේ I වැනි කාණ්ඩයේ VII වැනි පරිච්ඡේදයේ 5 වගන්තියට පහත පරිදි 5:8 ලෙස නව උපවගන්තියක් ඇතුළත් කිරීමටත්, නිලධරයකු සිය ඉල්ලීම පරිදි පූර්ව තනතුරට ආපසු පැමිණීමේ දී පිහිටුවිය යුතු වැටුප් පියවර සම්බන්ධව එකී පරිච්ඡේදයේ 6:3 උපවගන්තිය පහත පරිදි සංශෝධන කිරීමටත් 2019.05.28 දින පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත.

**"5:8 නිලධරයෙකුගේ වැටුප් වර්ධක දිනයත්, උසස්කිරීමේ දිනයත් එකම දිනකට යෙදෙන අවස්ථාවක දී එවැනි නිලධරයෙකු සඳහා උසස් කිරීම මත වැටුප් පරිවර්තනය කිරීම පැරණි තනතුරේ/ පන්තියේ/ ශ්‍රේණියේ එදිනට හිමි වැටුප් වර්ධකය ලබා දීම මත ලැබෙන වැටුප පදනම් කර ගනිමින් ඉහත විධිවිධාන පරිදි සිදු කළ යුතු ය.**

**6:3 කිසියම් නිලධරයෙකු, ඔහුගේම ඉල්ලීම මත ඔහු කලින් දැරූ තනතුරට හෝ ශ්‍රේණියට, පත්කිරීමේ බලධරයාගේ නිර්දේශ මත හා අමාත්‍ය මණ්ඩලයේ/ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමතිය මත ආපසු පත් කරනු ලැබුවහොත් එසේ ආපසු පත් කිරීම අලුත් පත් කිරීමක් සේ සලකා එසේ ආපසු පත් කරනු ලැබූ තනතුරට අයත් වැටුප් පරිමාණයේ නිලධරයා අවසන්වරට සේවය කළ පන්තියට/ ශ්‍රේණියට අදාළ ආරම්භක වැටුප ඔහුට ගෙවිය යුතුය."**

ජේ.ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ
ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශය